


# ආදරණීය දුවේ පුතේ...

වර්තමාන ලෝකයේ තාක්ෂණය යනු දවසින් දවස දැනුම වෙනස් වන විෂයකි. ලෝකය දැන් ගමන් කරමින් සිටින්නේ දැනුම මත පදනම් වූ අර්ථිකයක් කරාය. එම අර්ථිකය තුල  තාක්ෂණය සඳහා ඉතා විශාල ඉඩකඩක් වෙන්ව පවතී. උදාහරණයක් ලෙස ඔබෙත් මගෙත් ජීවිතයේ බෝහෝ ක්‍රියාකාරකම් දැන් තාක්ෂණික උපකරණයක් මත රඳා පවතී. මොහොතක් සිතන්න, උදෑසන අවදි වීමට ඔබ සූදානම් කරන ජංගම දුරකතනයේ ඇති Alarm මෘදුකාංගයේ සිට අභ්‍යවකාශ යානයක පාලන පුවරුව දක්වාම තාක්ෂණික දැනුම ගබඩා වී ඇත.  මේවා තුල යාන්ත්‍රික ඉංජිනේරු දැනුම, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු තාක්ෂණ දැනුම, සිවිල් ඉංජිනේරු තාක්ෂණික දැනුම සහා තොරතුරු තාක්ෂණික දැනුම අන්තර්ගතව පවතී. එනම්, වර්තමානයේදී මේ තරම් ඉහල තාක්ෂණය භාවිතා වන්නේනම් තවත් වසර 10, 15 කින් කෙතරම් දියුණු තාක්ෂණයක් සමග ඔබට සහ මට ගැටෙන්නට සිදුවේද යන්න සිතා බැලීම ඔබට භාරයි.

අද ඔබ අවුරුදු 16, 17ක පුංචි කෙල්ලෙක් හෝ කොල්ලෙක් විය හැක. එහෙත් ඔබගේ හැකියාවන් සහ දැනුම අනාගත දශකයකට දෙකකට ගැලපෙන පරිදි ඔබ වර්තමානයේදී සකසා ගත යුතුය.  වෙනසට වෙනස් වීමට නොහැකි වූ ඩයිනොසරයන් වැනි විශාල ජීවින් පවා මෙලොවින් තුරන් විය. ඒ වගේම මිට පෙර දශකයේ තිබු රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් අහිමි වී ඒ වෙනුවට තාක්ෂණික දැනුම මත පදනම් වූ රැකියා අවස්ථා නිර්මාණය වී ඇත. මේ නිසා ඔබද ඔබගේ දැනුම අනාගත ලෝකයට ගැලපෙන පරිදි වර්තමානයේදී සකස් කර නොගත්තොත් ඔබත් රැකියා විරහිත උපාධිධාරියෙක් හෝ  නැතහොත් අඩු ආදායම් ලාබී පවුලක හිමි කරුවෙක්ද විය හැක. එසේනම් ලංකාවට නොව ලෝකයට ගැලපෙන පරිදි තරගකාරී තාක්ෂණික විෂයක් තුලින් ඔබගේ ජීවිතය සුමට පහසු කලාපයේ සාර්ථක ජීවිතයක් බවට පත්කරගන්න.

## Mr. TECH
## මහේෂ් රණවක
MAHESH RANAWAKA
Engineering Technology (ET) University of colombo

# ONE MAN SHOW

# Ai යකා මෙල්ලකරන සාස්තරය ICT වලින් ඉගෙනගමු...

මේක සාම්ප්‍රදායික IT කෝස් එකක් නෙවෙයි. ලෝකේ ඉදිරියේ විහිලුවක් නොවී වීරයෙක් වෙන්න පුළුවන් Coures එකක්

මෙම පාඨමාලාව හදාරන ඔබට ලෝකෙම හොල්ලන කෘතිම බුද්ධිය එහෙම නැතිනම් Ai වලින් ගන්න පුළුවන් ප්‍රයෝජන ගොඩක් අපි කියලා දෙනවා


- Ai වලින් ලස්සන Graphic කරන හැටි
- Ai වලින් විෂය කරුනු හොයන හැටි
- Ai නිර්මාණ කරන හැටි වගේම ඔයාට අනාගත ලෝකයට වැදගත් ගොඩක් දේවල් අපි උගන්වනවා

## මීට අමතරව

- Software Development
- Web Development
- Game Development
- Robotic

**වගේ වර්ථමාන ලෝකයට ගොඩක් වැදගත් දේවල් මේ පාඨමාලාමේදී උගන්වනවා**

වැදගත්ම දේ තමයි අපි මේ දේවල් English වලින් වගේම තේරෙන සිංහලෙන් උගන්වන එක



## ICT
### විෂයට සම්බන්ධ පංතිය තුල සිදුකරන විෂය සමගාමී ක්‍රියාකාරකම්

මෙවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් තුලින් දරුවාගේ සිතීමේ ශක්තිය වැඩි දියුණු වන බව නිසැකය. උදාහරණයක් ලෙස විශ්වවිද්‍යාලයට තේරී පත්වන අපගේ දරුවන්ගෙන් බහුතර දරුවන් අධ්‍යාපනයට නැඹුරු වුයේ මෙම ක්‍රියාකාරකම් වලට සහභාගි වීමෙන් පසුවයි. අද ලෝකයේ ජනප්‍රිය අධ්‍යාපනය ක්‍රමය වන STEM අධ්‍යාපන ක්‍රමය උසස් පෙළ පන්තියකට ලංකාව තුලදී මුලින්ම හදුන්වා දුන්නේ අප වන අතර තවමත් වෙනත් උසස් පෙළ උපකාරක පන්තියක මෙවැනි ක්‍රියාකාරකම් දරුවන්ට ලබා නොදෙන බව වගකීමෙන් සහතික කරමි.

**පාඨමාලා ආරම්භය මැයි 20**

## Mr. TECH

අපේ IT පාඨමාලාවට සම්බන්ධ වීමට ඔයාගේ නම, පාසල ඉක්මනින්ම පහත අංකයට Whatsapp කරන්න...

**076 6883348**

A/L වලට IT, Tech කරපු Mr. Tech **අපේ දරුවන්ගේ ගොඩක් ජයග්‍රහණ** ඇතුළු පිටු වල

ඇතුළු පිටු වල




# ලංකාවේ හොඳම
# විභාග වැඩපිළිවෙල අපෙන්


- ඉහත සියළුම විභාග වල ලකුණු පළපුරුදු අධීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කර බලා ලකුණු ලබා දීම.





- අවශ්‍ය ඕනෑම විටෙක දෙමව්පියන්ට හෝ දරුවන්ට එම මොහොතේ දරුවන්ගේ ප්‍රගතිය බලා ගැනීමට පහසුකම සලසා ඇති සුපිරිතම වෙබ්අඩවිය මගින් පහසුකම සලසා දී ඇත. තවද, එම ප්‍රගති වාර්ථාව මාස් පතා නිවසටම තැපැල් මගින් ලබාදේ...







- දිනපතා පවත්වන Warm-up Quiz ප්‍රශ්න පත්‍ර
- මිශ්‍ර අභ්‍යාස ලබාදෙන Hidden Reminder ප්‍රශ්න පත්‍ර
- මාස 03කට වරක් පවත්වන Rankingsy විභාග මාලාව
- Online Exam

**අසමතුන් නොමැති සමතුන් පමණක් බිහිකරන Mr.TECH අපේ SMART වැඩපිළිවෙල**

එන්න බැරිවුනු දවසට

## පාඩම් මඟහැරෙයිද?



**Class එකේ කරන පාඩම් වල Recording ඕනම වාරයක් බලන්න පුළුවන් අපෙන් විතරමයි...**





- ලොව දියුණුම තාක්ෂණයක් යොදාගෙන තාක්ෂණික විෂයන් සඳහා අති නවීන **Online පංති විද්‍යාගාරය අප සතු වේ...**
- නුගේගොඩ නාගරයට අප හා ප්‍රායෝගිකව සම්බන්ධ විය නොහැකි දිවයින පුරා විහිදි ඕනෑම දරුවෙකුට **Online** හරහා Mr.TECH අප හා සම්බන්ධ වීමට ඇති පහසුකම් අප විසින් සපයා ඇත...





"
**Smart** පන්තියක් ඇතුලේ
**Smart** විදිහට
ඉගෙනගෙන නැද්ද,
**How Sad...**
**Try** කරල බලන්න
ආස හිතෙයි...






ඉහත සියලු
කඩයිම් වලින් ජයගත්
දරුවන් හා ඔවුන්ගේ
දෙමාපියන් ඇගයීමට ලක්කරන
**RANKINGSY**
**සම්මාන උළෙල**



තාක්ෂණ
විෂය ධාරාවේ
**සම්පූර්ණ කල යුතු**
**විෂය නිර්දේශය හා**
**යා හැකි**
**විශ්ව විද්‍යාල....**



- කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය
- කැළණි විශ්වවිද්‍යාලය
- රුහුණ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- අග්නි දිග විශ්වවිද්‍යාලය
- මොරටු විශ්වවිද්‍යාලය
  (ඇතැම් පාඨමාලා සඳහා පමණී )



- PHYSICS
- CHEMISTRY
- BIOLOGY
- IT
- MATHS

**SFT**
SCIENCE FOR TECHNOLOGY

- ELECTRONIC
- AUTOMOBILE
- CIVIL
- MECHANICAL
- ELECTRICAL

**ET**
ENGINEERING TECHNOLOGY

# 2026
GENERAL CERTIFICATE OF EDUCATION
**ADVANCED LEVEL**

# නව පන්ති ආරම්භය

- පළමු කණ්ඩායම — මැයි 19
- දෙවන කණ්ඩායම — ජුනි 02

**සාමාන්‍ය පෙළ අවසන් වූ විගසම**

**SFT** SCIENCE FOR TECHNOLOGY
Physical & Online
බදාදා
ප.ව. 3.00-5.30

**ET** ENGINEERING TECHNOLOGY
Physical & Online
ඉරිදා
පෙ.ව. 8.30-11.00

**සියලුම උසස් පෙළ පන්ති සඳහා විමසීම්.**

**076 6883348**


ලංකාවේ 01ම • ප්‍රැක්ටිකල් වැඩබිම...
**Mr.TECH** • MAHESH RANAWAKA



- SOFTWARE DEVELOPMENT
- WEB DEVELOPMENT
- ARDUINO
- IOT
- ROBOTIC
- COMPUTER HARDWARE

ICT
INFORMATION & COMMUNICATION TECHNOLOGY

Mr. TECH

# කැම්පස් යන්න කලින් CAMPUS අත්දැකීම



**ICT** INFORMATION & COMMUNICATION TECHNOLOGY

Physical & Online

ඉරිදා
පෙ.ව. 11.30-2.00

**Gravity Institute**

Mr. Tech Smart Class Room
නුගේගොඩ

## සාම්ප්‍රදායික උසස් පෙළින් වෙනස් වන අපේ

# Mr.TECH දරුවන්ගේ විවිධ දක්ෂතා







මම අසික පින්සර සමරසේකර , මාතකඩාර දෙළුම් ආයතනයේ අධ්‍යක්ෂක. මම කෘෂිකර්මයට එන්නෙ 2020 වසරේ..දෙළුම් වත්තක් වවාගෙන දවසක අගය එකතු කළ නිෂ්පාදන දක්වා එන්න ඕන කියල හිතල ආව මේ ගමනේදි විවිධ වූ බාධක වලට මූණ දුන්න. පහුගිය කාලෙ සමාජ මාධ්‍ය හරහා අඳුරගත්ත මිතුරෙක් තමයි මහේෂ් රණවක ගුරුතුමා. මහේෂ් සර් මගේ ගමන ගැන හොඳ නිරීක්ෂනයෙන් ඉදල තියෙනවා. ඔය අතර මහේෂ් සර් මගේ දෙළුම් පාරිභෝගිකයෙක් බවට පත්වුනා. ඉතින් මගේ උත්සාහය දැකල මහේෂ් සර්ට හිතිල තියෙනවා මට උදව්වක් කරන්න. එයා මට කතා කරල කිව්ව "මගේ සිසුන් ලවා ඔබට නොමිලේ වෙබ් අඩවියක් හදලා දෙන්නම්." ඇත්තටම මේක ඇහුවම.මට ගොඩක් සතුටුයි .මොකද අපි ඉදිරියේදී කරන්න හිතාගෙන හිටපු දෙයක් වෙබ් අඩවියක් නිර්මාණය කරගැනීම. ඒක ඉක්මන් වීම සහ නොමිලේම ලැබීම කියන්නෙ අපිට ලැබෙන විශාල පිටුවහලක්.

ඉතින් මහේෂ් සර්ගෙ ශිෂ්‍ය පුතාල ටිකක් එකතු වෙලා වැඩේ කරන්න පටන් ගත්තා. ඇත්තටම මම ව්‍යාපාරය එක්ක ගොඩක් කාර්යබහුල වුනත් ඒ පුතාල ඉතාම හොඳ ඉවසීමකින් ඒ වැඩේ කරල දුන්නා. මශේෂ් සර්ගේ සිසුන් ඉතාම දක්ෂයි. ඔවුන්ගේ වෙබ් අඩවිය දැකල.මම පුදුම වුනා. ඒක ඉතාම අපූරුවට හදල තියෙනවා. හරිම ආඩම්බරයි ඒ වගේ වයසක දරුවන්ගේ දක්ෂතාවයන් දැක්කාම.වෙබ් අඩවිය නිසා මගේ ව්‍යාපාරයට ඉතාම හොඳ අලංකාරයක් එකතු වුනා. සමාජ මාධ්‍යට පමණක් සීමාවී තිබුනු මගේ ප්‍රචාරණය වෙබ් අඩවි මට්ටමට ගියා. මට ඒ හරහා ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීම සඳහා විශාල සහයක් ලැබුනා. මම හදවතින්ම මහේෂ් රණවක සර්ට සහ මාතකඩාර දෙළුම් වෙබ් අඩවිය නිර්මාණය කර දරුවන්ට ස්තූතිවන්ත වෙනවා.

SoftByte කියන අපි හදාගත්ත Brand එකෙන් අපි කරපු පළවෙනි project එක තමා මාතකඩාර Website එක www.mathakadara.com අපේ Company එකෙන් ඇත්ත Client කෙනෙක් කරපු පළවෙනි Project එක. අපි ඒ project එකෙන් Client කෙනෙක් එක්ක වැඩ කරද්දි ගන්න පුලුවන් හොඳම Experience ටික ගත්තා. Team එකක් එක්ක ඇත්තටම වැඩ කරද්දි ගොඩක් ප්‍රශ්න එනවා. ඒක සාමාන්‍යයි. හැබැයි අපි ඔක්කොම එකට වැඩ කරලා අන්තිමට Client ව හොඳට satis වෙන්න වැඩේ ඉවර කලා. මහේශ් සර් ට ස්තූති කරන්න ඕනෙ අපේ පිටිපස්සෙන් ඉදලා දුන්න support එකට.

Thank You
Mr.TECH

● https://mathakadara.com/




# Our team

Chamodi Ama
Mahinda Rajapaksha College

Ashan Shaluka
Maharagama Central College

Thishan Sankalpa
Maharagama Central College

Ranithu Shenal
Nalanda College

Chanduni Apurwa
Gothami Balika Vidyalaya

Kavindu Shehan
Mahinda Rajapaksha College

Shakuntha Chandimal
Boys' Model School - Malabe

Pasan Sandeepa
Mahinda Rajapaksha College

Irosha Lakshan
Ananda College

Kavindu Methsara
Mahinda Rajapaksha College

Diyuranga Theekshana
Ananda College





# ලංකාවේ 01ම ප්‍රැක්ටිකල් වැඩබිම

## ET PRACTICAL

උසස් පෙළ විභාගයට පෙර අදාල පාඩම සමගම සියළුම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ප්‍රායෝගික ආකාරයට සිදු කරන අප එමගින් විෂය නිර්දේශය සහ ඉන් ඔබ්බටත් අවශ්‍ය සියලුම කුසලතා සංවර්ධනය කරනු ලබයි.

**ලකුණු 30ත් ලේසියෙන්ම අපෙන්...**



# Mr.TECH

සමඟ එකතුවී ලොවක් සමග ජීවිතය ජයගත් අපේ දරුවන් අතරින් කිහිප දෙනෙක්...

# ගොඩයන්න නම් ගොඩවෙන්න ඕනම් තැන...

තව වැඩ ඕන තරම් තියෙනව ගිහින් බලන්න... www.mrtech.lk



## ශාකුන්ත චන්දිමාල් අතුකොරළ

**මාලඹේ ආදර්ශ පිරිමි විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2023**

මම ශාකුන්ත චන්දිමාල් ඔබට මාව හඳුන්වා දිමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙමි. මම මේ වන විට Software Developer කෙනෙක් ලෙස, UK Startup එකක් සමඟ වැඩ කරමි. Software Developer ක්ෂේත්‍රයේ මගේ ගමන ආරම්භ වුනේ 2023 දි මම ශ්‍රී ලංකාවේ Software Developer සමාගම සමඟ වැඩ කිරීමට පටන් ගත් අවස්ථාවේදීය. මගේ මහන්සි වී වැඩ කිරීම සාර්ථක වු අතර , UK Startup එකක් සමඟ වැඩ ආරම්භයක් සමඟ අද, මම සාර්ථක  Software Developer කෙනෙක් ලෙස Projects සමඟ වැඩ කරන බව පැවසීමට මම ආඩම්බර වෙමි.

ඇත්ත වශයෙන්ම, මගේ ජීවිතයෙ ඉතා වැදගත් පුද්ගලයින් කිහිප දෙනෙකුගේ සහයෝගය සහ මග පෙන්වීම නොමැති නම් මෙම සාර්ථකත්වය ලබාගත නොහැක. ඒ අයගේ කෙනෙක් තමයි මට සැබෑම ගුරුවරයෙකු වූ මගේ ගුරුවරයා වන මහේෂ් රණවක. ඔහු මට Software Developer කෙනෙක් ලෙස සාර්ථක වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දුන්නා පමණක් නොව, වඩා හොඳ පුද්ගලයෙකු වීමට මට උදව් කලා. මම අද සිටින තැනගැන කිව නොහැකි තරම් සතුටු වෙනවා. මම Software Developer කෙරෙහි දැඩි ඇල්මක් දක්වන අතර වෘත්තිකයෙකු ලෙස ඉගෙනීමට සංවර්ධනය වීමට ම සෑම විටම උනන්දු වෙමි. ඒ වගේම මම A/L වලට ඉගෙන ගන්න මේ කාලය ඇතුලත මෙවැනි දෑ කිරීමට හැකිවීම ගැන මා සතුටු වෙමි. Thank You Mr. TECH

**ඇත්ත වශයෙන්ම, මගේ ජීවිතයෙ ඉතා වැදගත් පුද්ගලයින් කිහිප දෙනෙකුගේ සහයෝගය සහ මග පෙන්වීම නොමැති මට මෙම සාර්ථකත්වය ලබාගත නොහැක. ඒ අයගේ කෙනෙක් තමයි මට සැබෑම ගුරුවරයෙකු වූ මගේ ගුරුවරයා වන මහේෂ් රණවක. ඔහු මට Software Developer කෙනෙක් ලෙස සාර්ථක වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දුන්නා පමණක් නොව, වඩා හොඳ පුද්ගලයෙකු වීමට මට උදව් කලා.**



## ඩබ්.පී. ඉරෝෂ ලක්ෂාන් පෙරේරා

**ආනන්ද විද්‍යාලය, කොළඹ.**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2023**

අවුරුද්දක් වගේ පොඩි කාලයක් ඇතුලත මගෙ ජීවිතේ ගොඩාක් වෙනස් කරන්න මග පෙන්වපු ගුරුවරයා තමයි මහේෂ් සර්. සර් උගන්වන විදියට සම කරන්න බෑ කාටවත්. ඇත්තටම පන්තියට ආවෙ A/L ගොඩදාගන්න බලාගෙන. හැබැයි ඒ විතරක් නෙමෙයි, ඊට වඩා ගොඩාක් වටින දේවල් කරගන්න සර් උදව් කලා. අපි එකතු වෙලා website හැදුවා එක එක software development projects වල වැඩ කලා. මේ වෙද්දි මාසෙට හොඳ පඩියකට part-time job එකක් කරනවා UK company එකක. කිසි දේකට බයවෙන්න එපා උනන්දුව තියෙන ඕන එකෙක්ව මහේෂ් සර් ගොඩ දානවා. ගොඩ යන්න නම් ගොඩ වෙන්න ඕන හොඳම තැන, Mr.Tech

**මේ වෙද්දි මාසෙට හොඳ පඩියකට part-time job එකක් කරනවා UK company එකක.**

## කවිඳු ශෙහාන්

**මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2024**



මහේෂ් සර් ව මට හම්බවෙන්න 5 වසරේදී. එත් එදා සර් ව හම්බවුන නිසා මගෙ ජීවිතේ මට මේ කාලෙදි තනියෙන් ලබාගන්න බැරි තරම් ගොඩක් දේවල් මට හම්බුනා .. සර් ගාව තියෙනවා පට්ට talent එකක් ..ඒ තමා කවුරුහරි කෙනෙක්ගෙ හැකියාව එලියට ගන්න එක.. තාම මම සර්ව සම්පූර්ණ නැති උනාට මට විශ්වාසයි ලගදිම දවසක ඒ දේ මට ලැබෙනව කියලා. එදා පලවෙනි Wire කෑල්ල අමුනලා arduino code එක ගහල පටන් ගත්ත වැඩේ ඉදන් අද මේ ඉන්න තැනට එන්න හරි පාර පෙන්නුවෙ සර්.. ඉතින් ඒ පාරෙ ආපු නිසා මම අද mobile application development , web site development , වගේ ICT side එකේ ගොඩක් දේවල් කරන්න පුලුවන් උනා..ඒ දැනුම ටිකෙන් මම අද A level exam එක ලියන්නත් කලින් software development කරන company එකක training වෙන්න අවස්ථාවක් හම්බුනා. ඒ වගේම සර් විතරක් නෙමෙයි MR.Tech Team එකම මට ගොඩක් උදව් කලා මේ තැනට එන්න..

**එදා පලවෙනි Wire කෑල්ල අමුනල arduino code එක ගහල පටන් ගත්ත වැඩේ ඉදන් අද මේ ඉන්න තැනට එන්න හරි පාර පෙන්නුවෙ සර්.**



## මිණිඳු තිරංජය

**මහින්ද රාජපක්ෂ විද්‍යාලය, හෝමාගම.**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2022**

මම මුලින්ම සර් ගාවට එනකොට subject වල මුකුත්ම දන්නේ නෑ. තියෙන පාඩම්වත් දන්නේ නෑ. මම කරන්න ඕනේ නිසා ict කලා.සර් පයිතන් කරන්න කලින් අපිට programming විදියට Arduino වලින් පොඩි line following robot කෙනෙක් හැදෙව්වා. ඒක කරල පයිතන් කලාට පස්සේ තමයි ict වලට පොඩි ආසාවක් ආවේ. සර්ගේ දේව බලයක් නිසා ආසම නැති විශයකට ආසාවක් ඇති කලා. පස්සේ ජනිත් අයියා එක්ක වැඩ කරා. එතනින් ලොකු experience එකක් ගන්න හම්බුණා. ඒවත් එක්ක පොඩි පොඩි project කලා. මුලින්ම e-commerce site එකක් develop කරන්න ආවේ. මේ දේවල් නිසා exam එකටත් ලොකු උදව්වක් වුණා සමහර දේවල්වලට. දැනටත් software developer කෙනෙක් විදියට වැඩ කරගෙන යනවා. මේ හැමදේකටම සර්ට Thank you. ජීවිතේ වෙනස් වුණ තැන හරි පාර පෙන්නපු තැන Mr.Tech

**මේ හැමදේකටම සර්ට Thank you. ජීවිතේ වෙනස් වුණ තැන හරි පාර පෙන්නපු තැන Mr.Tech**



**Mr.Tech එකත් එක්ක මේ වැඩ කරපු ටික කාලයට ඒ හැමදේම වෙනස් වුනා. කෙටියෙන් කිව්වොත් ලංකාවේ සුළු ප්‍රදේශයක පිරිසකට Pencil Art ඇඳපු මම අද විදේශ රටවල පාරිභෝගිකයන්ට UI Design, 2D animation වගේම වෙබ් අඩවි නිර්මාණය කරනවා.**

## ඩබ්. මතීෂ මිහිනාත් ප්‍රියන්ත

**මහරගම මධ්‍ය මහා විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2023**

---

මම 2021 දී Mr. Tech එක්ක එකතුවෙනකොට මං අහිත් ළමයි වගේ මට තියන හැකියාවලින් වැඩක් ගන්නේ කොහොමද, තියන හැකියාවට ලෝකයේ තියන අවස්ථාවේ මොනවාද කියලා තේරුමක් නොතිබුන කෙනෙක්, නමුත් Mr.Tech එකත් එක්ක මේ වැඩ කරපු ටික කාලයට ඒ හැමදේම වෙනස් වුනා. කෙටියෙන් කිව්වොත් ලංකාවේ සුළු ප්‍රදේශයක පිරිසකට Pencil Art ඇඳපු මම අද විදේශ රටවල පාරිභෝගිකයන්ට UI Design, 2D animation වගේම වෙබ් අඩවි නිර්මාණය කරනවා. මේ වන විටත් මම මගේ කණ්ඩායමක් එක්ක එංගලන්තයේ පාරිභෝගිකයෙකුට වෙබ් පිටුවක් නිර්මාණය කරනවා නිකම් නෙවෙයි ඒකට අපිට ලැබෙන්නේ ඩොලර්වලින්, මම හෙව්වේ අ.පො.ස. උසස් පෙළ විභාගය ගොඩදාගන්න පන්තියක්. නමුත් උසස් පෙළ විභාගය ගොඩදාගන්න ගමන් ජීවිතයත් ගොඩදාගන්න පුළුවන් තැනක් වුනා. Mr.Tech අපිට.

## විහඟ සපුමල්

**මහින්ද රාජපක්ෂ විද්‍යාලය, හෝමාගම**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2022**

---

මහේෂ් සර්ගේ MR.Tech class එකෙන් පාඩම් වල Theory පැත්ත විතරක් නෙවෙයි Practical පැත්තටත් අපිව ගොඩක් යොමු කලා. මම ICT වලටත් සර්ගේ Class ගිය නිසා ඒ පාඩම් practically කරනකොට IT ක්ෂේත්‍රයට ලොකු ආසාවක් ඇති උනා. එතන ඉදන් IT Field එකට අදාල දේවල් හොයන්න පටන්ගත්තා. මහේෂ් සර්ගෙනුත් ගොඩක් උදව් හම්බුනා. අපිට තනියම දෙයක් හොයාගන්න හැටි Research එකක් කරන හැටි පවා සර් කියල දුන්නා. මම සහභාගි වුන පලවෙනි Real world Project එකත් සර්ගෙන් කරන්න ලැබුන එකක්. ගොඩක් අත්දැකීම් එක්ක මම අද වෙනකොට A/L ලියල ඉවර වෙලා Software Company එකක Junior Software Developer කෙනෙක් විදියට වැඩ කරනවා සර් නිසා.............



**මම අද වෙනකොට A/L ලියල ඉවර වෙලා Software Company එකක Junior Software Developer කෙනෙක් විදියට වැඩ කරනවා සර් නිසා.............**



## සන්දීප මුතුමාල්

**ආනන්ද විද්‍යාලය, කොළඹ.**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2021**

මම සර්ගේ class එකට සම්බන්ධ වුනේ 2022 සර්ගේ online class එකට. ඒක ඇතුලේ අපිට දැනුනේ නෑ ඒක online කියලා. ඒ තරම් සර් අපිත් එක්ක හැමදේම ඕනෑම වෙලාවක ප්‍රායෝගික ව කියලා දුන්නා. මම පළවෙනි දවසේ ඉදන් සර්ගේ මගපෙන්වීම යටතේ වැඩ කරන්න යන අතරේ සර් දවසක් අපිට Java Programming Class එකක් කළා. ඒ වෙද්දි මම IT field එකට ලොකු ආසාවක් තිබ්බේ නෑ. හැබැයි ඒ class එක තමා මගේ හැරවුම් ලක්ෂය. ඒ ආසාව ඇති කලේ සර්. එතනින් පස්සේ පාඩම් වැඩ හොඳින් කරන ගමන් මං අර දේවලුත් ඉගෙන ගත්තා. සර්ගෙ මගපෙන්වීම නිසා මට ඒ දේවල් balance කරගන්න පුළුවන් වුනා. උනන්දුව, ආශාව තියෙනවනම් ඕනෑම දෙයක් කරන්න පුළුවන්. ඒ විදියට සර් කියන දේවල් ඒ විදියටම කරපු නිසා මට විෂයන් 3ටම A සාමාර්ථ 3ක් සමඟින් කොළඹ දිස්ත්‍රික්කයේ 12 වන ස්ථානය ලබාගෙන ඉහලින්ම සමත් වුනා. එතනින් පස්සේ සර් අපිට ජීවිතේ පෙන්නුව නිසා අද මම ලංකාවේ ප්‍රධාන Software company එකක junior software developer කෙනෙක් විදියට වැඩ කරලා මගේ සරසවි ගමන ආරම්භ කරනවා. ඉතින් නංගී, මල්ලී, විශ්වාසයෙන් මම ඔයාලට ආරාධනා කරනවා ඔයාලගේ A/L exam වගේම ජීවිතේ ගොඩදාගන්න ගොඩවන්න හොඳම තැනට. ඒ Mr. Tech ලංකාවටම එකයි.

**IT field එකට ලොකු ආසාවක් තිබ්බේ නෑ. හැබැයි ඒ class එක තමා මගේ හැරවුම් ලක්ෂය.**

**සර් කියන දේවල් ඒ විදියටම කරපු නිසා මට විෂයන් 3ටම A සාමාර්ථ 3ක් සමඟින් කොළඹ දිස්ත්‍රික්කයේ 12 වන ස්ථානය ලබාගෙන ඉහලින්ම සමත් වුනා.**

## ජනිත් සංජන

**පිලියන්දල මධ්‍ය මහා විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2020**

උසස්පෙලට කරන්න විෂයක් නැති මට කිසිම අරමුණක් නැතිව 2018 දි ටෙක් කරන්න තෝරගෙන මම මුලින්ම ආවේ මහේෂ් සර්ගෙ SFT පංතියට.ඒ වෙනකොටත් සර්ගෙ පලවෙනි A/L Batch එක උනේ අපි. Tech කරන්නේ ඇයි මේක ඉගෙනගෙන ඉස්සරහට මොනාද කරන්නේ කියල අපි කවුරුත් ඒ වෙද්දි දැනගෙන හිටියෙ නැහැ. ලංකාවෙ බහුතරයක් තාමත් දන්නෙ නෑ. මේ වෙනකොට අපිත් එක්ක සර්ගෙ මග පෙන්වීම යටතේ උනන්දුවෙන් වැඩ කරපු මගේ වයසෙ අය 2021, 2022, 2023, මේ ඊයෙ පෙරේදා O/L ලියපු නංගිලා මල්ලිලාගෙ පවා ජීවිත වෙනස් කරපු විදිහ දකිනකොට හිතෙනවා, සර් Tech උගන්වන්න ගත්තෙම මේ සාම්ප්‍රදායික Tech කෙරුවාව වෙනස් කරන්නමයි කියලා... සාමාන්‍ය Tech විෂයන් තුනම (SFT, ET,ICT) උගන්වන පංති තුනක් සහ Mr.TECH සංසන්දනය කර බැලුවොත් ඒ සම්ප්‍රදාය වෙනස් කරල බැලූ බැල්මට පේන්න තියෙනවා. මම අද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ මෘදුකාංග ඉංජිනේරු උපාධියේ දෙවන වසර හදාරන ගමන් ඇමරිකාවේ ආයතනයක Web Engineering තනතුරෙ වැඩ කරනවා...

මේ ICT field එකේ වටිනාකම ,මේකෙන් අපිට යන්න පුලුවන් දුර පෙන්නුවේ මහේශ් සර්. සර්ගෙ හැම Batch එකෙන්ම පාර පෙන්නුවහම දුර යන්න ආසාවක් තියෙන ලොකු සේනාවක් දැන් අපිත් එක්ක සාර්ථකත්වයට යනවා. ඉස්සරහටත් ඒක වෙනවා. එතනින් තමයි Mr.TECH අනිත් අයගෙන් වෙනස් වෙන්නෙ. රැල්ලට TECH කරන්න එපා. ඒලෙවල් වලින් ජීවිතේ වෙනස් කරගන්න. සාම්ප්‍රදායික Tech කෙරුවාවෙන් සහ තව කෙනෙක්ගෙ වාසියට මවපු සුරංගනා ලෝක වලින් එලියට ඇවිල්ලා ජීවිතේ දිනන්න ඉගෙනගන්න.. ඔයාට ගැලපෙන ඔයාගෙ පාර හොයාගන්න... Mr.Tech එකට ඇවිල්ල බලන්න...



**සර් Tech උගන්වන්න ගත්තෙම මේ සාම්ප්‍රදායික Tech කෙරුවාව වෙනස් කරන්නමයි කියලා... සාමාන්‍ය Tech විෂයන් තුනම (SFT, ET,ICT) උගන්වන පංති තුනක් සහ Mr.TECH සංසන්දනය කර බැලුවොත් ඒ සම්ප්‍රදාය වෙනස් කරල බැලූ බැල්මට පේන්න තියෙනවා. එතනින් තමයි Mr.TECH අනිත් අයගෙන් වෙනස් වෙන්නෙ. රැල්ලට TECH කරන්න එපා.**

# ප්‍රතිඵල වලින් ලංකාවේම අංක 01



**යශාදි හිරුණිකා**
**මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම**
**ජෛව පද්ධති තාක්ෂණවේදය - 2021**

මම සර්ගෙ class එකට ආවේ 2021 අන්තිම කාලේ යාලුවෙක් කිවුව හොද සර් කෙනෙක් කියල. ඒත් එනකම් කිසිම අදහසක් තිබ්බෙ නෑ. හැබැයි ආව පලවෙනි දවසෙම හිතුනා අපරාදෙ කලින් ආවෙ නැත්තෙ කියල. මන් ආවෙ sft වලට විතරයි ඒත් අපිට Tech කරන bst practical ගොඩක් සර් අපිට කරල දුන්න. Sft වලත් හැම පාඩමක්ම මුල ඉදන් කියල දුන්න ඒ හින්දම තමා sft වලට ආසාවක් ආවෙ. A/L exam ලන් වෙද්දි රෑ එලිවෙනකන් online papers කෙරෙව්ව. මට AAB සාමාර්ථ වගේම කොලඹ දිස්ත්‍රික්කයෙන් 9 වෙනි ස්ථානය ලබාගන්න පුලුවන් වුනේ සර්ගෙ කැපවීම හා දිරිගැන්වීම නිසා. ඉතින් A/L technology කරන සහ කරන්න හිතන් ඉන්න හැමෝටම කියනව දවසක් ඇවිත් බලන්න ඔයාලගෙ සරසවි සිහිනෙ වගේම ජිවිතේ ජයගන්නත් තියන හොදම තැන Mr.Tech විතරයි.



**එච්.ඩබ් සන්දීප මුතුමාල්**
**කොළඹ ආනන්ද විද්‍යාලය**

මම සර්ගෙ class එකට සම්බන්ධ වුනේ 2020 දී., ඒ වෙද්දී මට ඔන්ලයින් class එපාවෙලා තිබ්බෙ. හැබැයි සර් එක්ක වැඩ කරද්දී ඒක ඔන්ලයින් ද කියලවත් දැනුන් නෑ. සර් අපිට වෙලාව නොබලා හැමදෙයක්ම ප්‍රායෝගිකව කියලා දුන්නා.. මම මුල ඉදලම විශයන් තුනේම වැඩ සර් කියපු විදිහටම කලා.. ඒ නිසාම මට විශයන් 3 ටම A සාමාර්ථ 3 ක් සමග කොලඹ දිස්ත්‍රික්කයේ 12වන ස්ථානය ලබාගෙන ඉහළින්ම සමත්වෙන්න පුළුවන් වුනා.. සර් අපිට exam එක විතරක් නෙමේ එතනින් එහා ජීවිතේ දිනන්නත් පාර පෙන්නුව නිසා මම අද කැම්පස් යන්න සූදානම් වෙනගමන් ලංකාවේ ප්‍රධාන software company එකක web application developer කෙනෙක් විදියට වැඩ කරනවා.. Mr.Tech කියන්නේ සාම්ප්‍රදායික ටියුෂන් එකක් නෙමේ. ඒක වෙනස්ම තැනක්. ඉතිං නංගී,මල්ලී මං ඔයාලට විශ්වාසයෙන් ආරාධනා කරනවා exam එකත් ඉහළින්ම සමත් වෙලා ඉදිරි ජීවිතෙත් සාර්ථක කරගන්න එකතුවෙන්න ලංකාවේ තාක්ෂණවේදී විශයන් 3 ම උගන්වන එකම හා හොදම ගුරුවරයා ලගට... ඒ Mr.Tech - මහේෂ් රණවක සර්



**ආසිත් ඉමිසර ගමගේ**
**කොළඹ ආනන්ද විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2021**

කොවිඩ් 19 සීසන් එක පටන් ගද්දී අපිට පාසල් වගේම පන්ති යන එකත් නතර වෙනවා. 2020 දී අහම්බෙන් වගේ තමා මහේෂ් සර් හම්බ වෙන්නේ.සර්ගේ වැඩ පිළිවෙලත් එක්ක අපි දවසට පැය 15කට වඩා ඔන්ලයින් එකේ වැඩ කළා. ඒ වගේම සිලබස් එකෙන් එහාට ගියපු දේවල් ගොඩක් ඉගෙන ගන්න අවස්ථාව ලැබුණා. උසස්පෙළ විභාගයෙන් A2 B1 ප්‍රතිඵලයක් එක්ක කොළඹ දිස්ත්‍රික්කයේ 36 වැනි තැන ලබාගන්නත් හැකියාව ලැබුණා. ඒ නිසා ඉංජිනේරු තාක්ෂනවේදය ඉගෙන ගන්න කෙනෙක්ට යන්න පුළුවන් හොදම විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අද මම තේරී පත්වෙලා තියෙනවා. MR.Tech කියන්නේ අමතර පන්තියකට එහා ගියපු තැනක්. මහේෂ් සර් ළග තියන සංකල්පත් එක්ක ඕනම කෙනෙක්ට පහසුවෙන් වැඩකරගන්න පුළුවන්.

**මෙතෙක් පැමිණි 100% ම සමත්,**
**50% වැඩි විශ්වවිද්‍යාල වරම් හිමිකරුවන් එකම වැඩබිම**



**ඩී. රොමෙත් සත්නිදු**
**ආනන්ද විද්‍යාලය**

මං AL කරේ ඉස්කෝලෙ cricket ගහන්න ඕන නිසා. AL මුල් කාලෙ පංතිවලට ගියා ඒත් කිසිම ආසාවක් තිබ්බෙ නෑ ඉගෙන ගන්න දේවල් ගැන, covid season එක පටන් ගත්තම ගිය පංතිත් හෙමීට අත අරුනා. පංතියෙ වැඩ කෙරුන විදියට ආස හිතුන. සර් ඒ දවස් වල campus ගැන කියනව ඉතින්. මට campus යන්න ආසවල් තිබ්බෙ නෑ, විභාගෙ ගොඩ දාගන්න විතරයි ඕන උනේ. මන් නිකන් අම්මගෙන් නිකමට අහල බැලුව "අම්මෙ මං campus Select උනොත් කොහොමද කියල" අම්මගෙ මූනෙ තිබ්බ හිනාව දැකල මං එදා හිතගත්තා කොහොමහරි ගේමක් ගහල campus යනව කියල. සාමාන්‍යයෙන් campus select උන අය කියන්නෙ එදා වැඩ එදාම කරා කියල... එහෙම දේවල් නම් කලාතුරකින් තමයි මගේ අතින් උනේ. සර්ගෙන් ගුටිත් කාල තමයි මේ result එක දැම්මෙ සර් මූ වැඩ කරන්නෙ නෑ කියල පංතියෙ හිටිය ළමයිව අතඇරල දැම්මෙ නෑ. පංතියෙ තිබ්බ විභාග වල හොද ලකුණු ගන්න ආස උනා. අන්තිමට cricket ගැහිල්ලත් පැත්තකින් තියල විභාගෙටම බැහැල වැඩ කරන්න ගත්තා. පංතියේ කොහොමත් syllabus එක තුන් හතර පාරක්ම cover උනා. මම දැන් රුහුණ විශ්වවිද්‍යාලයේ BET(Hons) උපාධියක් හදාරනවා.



**එම්.ඒ. චාමික දුල්මිණ වීරසිංහ**
**ආනන්ද විද්‍යාලය කොළඹ**
**ඉංජිනේරු තාක්ෂණවේදය - 2021**

2021 නොවැම්බර් මාසේ තමයි physically Mr.Tech ඉස්සෙල්ලාම දකින්නේ. එතනින් පස්සෙ දිගටම Mr.tech tute ටිකත් එක්ක වැඩ ටික කරලා Colombo district 205 rank එකට ආවා government university යන්නම. මම දැන් Marine Engineer කෙනෙක් වෙන්න ඉගෙනගන්නවා Private University එකක. එක එක අයගේ හීන වෙනස් ඒ හීනවලට යන්න තමන්ගේ උවමනාව කැපවීම අනිවාර්යයි. මම හීන අතහරින්න හිතන තැන් වලදී මට motivation එකක් හැමවෙලේම Mahesh Sir දුන්නා. පංතියට එන ළමයි තමන්ගේ සහෝදර සහෝදරියන් කරගෙන එයාලගේ exam වලින් පස්සේ අනාගතය සැලසුම් කරන්නත් Mr.tech අපි එක්ක ඉන්නවා.



**පී. ජී. පවරිඳු දැහැන් අජින්ත**
**හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය**

කොරෝනා වසංගත තත්ත්වය නිසා මට සර් සමඟ එකතු වෙන්නට ලැබුණේ Zoom Meeting එකකින්. මම මහේෂ් සර් පැවැත්වූ සියලුම (Online ) පන්තිවලට පමණක් සහභාගී වුණා.. සර් අපිට මඟ ඇරෙන දවස් වල recording බලන්න විෂය කරුණු නැවත නැවත අවබෝධ කරගන්න. සර් අපිට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සහිත ප්‍රශ්න පත්‍ර කට්ටල ගෙදරටම ලැබෙන්න සැලැස්සුවා..සියලුම ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කළා.. මඟ ඇරෙන සියලුම පාඩම් කොටස් නැවත හොඳින් අවබෝධ කරගැනීමට මට සර්ගෙ website එක ගොඩක් උදව් වුණා. සර් හොඳින් අපිට ET විෂය තුළ තිබූ ප්‍රායෝගික දේ අවබෝධ කර දුන්න නිසා උසස්පෙළ විභාගයේ ප්‍රශ්න පත්‍රයට මුහුණ දීමේදී එය ගොඩක් පහසුවක් උනා.. උසස්පෙළ විභාගයෙන් පසුව අපට තිබූ ප්‍රායෝගික පරීක්ෂණයෙන් මට Electical/Electronic කොටසේ සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හැකි වුණේ මහේෂ් සර් තුළ තිබෙන සම්ප්‍රදායෙන් ඔබ්බට ගිය ඉගැන්වීමේ කුසලතාව නිසයි.. මට උසස්පෙළ විභාගයෙන් ET විෂයට B සාමාර්ථයක් සහිතව දිස්ත්‍රික්කයේ 122 ස්ථානයට පැමිණීමට හැකියාව ලැබුණේ හරි තැනින් හරි දේ ඉක්මනින් අවබෝධ කරගැනීමට හැකි වූ නිසයි.. මම දැනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි BET(Hons) අපේක්ෂකයකු ලෙස මගේ අධ්‍යාපනය කටයුතු සිදු කරනව.



**ඩී. ජී. පසලිඳු සවන් අජින්ත**
**හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය**

මම පන්තියට සම්බන්ධ වෙද්දි ET විෂයේ පොඩි කොටසයි දැනගෙන ඉදියේ පොඩි කොටසක් කිව්වට දන්නෙ නැති තරම්. සර්ගේ පේපර් කලාම අඩු පාඩු තියන ඒවත් හොයාගන්න ලේසි උනා. සර් විෂයට අදාල පාඩම් ඔක්කොම දෙපාරක් උගන්නන නිසා මට නොතෙරුන තැන් අඩු පාඩු ඔක්කොම මම හදාගත්තා. සර් අපිට ප්‍රායෝගික පරීක්ෂණයට අදාල විෂය කොටස් විභාගයට කලින් කියලා දුන්න නිසා ET විෂයට අදාල සිද්ධාන්ත කොටස් ගොඩක් ලේසියෙන් තේරුම් ගන්න පුළුවන් උනා. විභාගයට පසු ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන්නට පෙරත් අපිට නැවතත් ප්‍රායෝගික පරීක්ෂණයට අදාල විෂය කොටස් දවස් 7ක වැඩමුළුවක් තියලා උගන්වපු නිසා ප්‍රායෝගික පරීක්ෂණය ඉතා පහසුවෙන් කරගන්න පුළුවන් වුණා. 2021/2022 අ.පො.ස උසස් පෙළ විභාගයෙන් ඉංජිනේරු තාක්ෂණවේදය විෂයට B සමාර්ථයක් ලබා ගනිමින් දිස්ත්‍රික්කයේ 126 වන ස්ථානය ලබා ගැනීමට මට හැකි උනා. මම දැනට ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨයේ තාක්ෂණවේදී ගෞරව උපාධිය BET(Hons) හදාරන සිසුවෙකු වෙනවා. මම දැකපු නිහතමානී ගුරුවරයෙක් වන අතර ගුරු මුෂ්ටිය ලඟ තබා නොගෙන විෂයානුබද්ධ දේවල් වලට අමතරව නූතන තාක්ෂණවේදයද (Modern Technology) කිසිම අඩුවක් නොමැතිව තම සිසුන්ට ලබා දෙන ගුරුවරයෙක් වීම.

**කේ .එච්. දයාන් නිරංජන පල්ලේගම**
**කොළඹ ආනන්ද විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂණවේදය -2021**



මගේ හොදම යාලුවෙක් එවපු group එකකට join වෙලා පටන් ගත්තු Mr.Tech ගමන සර් එක්ක අවුරුද්දකට වැඩි කාලයක් එකට ඉදන් අපිව විභාගය දක්වා අරන් ගිහින් මට A/L වලට A1 , B 2 වගේ හොද result එකක් අරන් කොළඹ දිස්ත්‍රික් 89 වගේම ලංකාවෙන් 691 වෙන්න දීපු හයිය කියල නිම කරන්න බැහැ . ඊට අමතරව techonology සම්බන්ධ projects වගේම පොතේ පතේ දැනුමට එහා ගියපු practical දැනුමක් දීපු , හිතන්න පුළුවන් ප්‍රායෝගික මිනිස්සු හදපු එකම තැන Mr.Tech

මම සර්ගේ class ආවේ A/L වලට හරියටම මාස 3 ක් තියෙද්දි , වාසනාවට sir ව හම්බුනා වගේ වාසනාවට විභාගත් කල් ගියා. class එකට ඇවිල්ල සති 2-3 ක් යද්දි sir කිව්වා ඔයා A/L වලට rank එකක් දානව කියල, හොදම කාලේ උනේ අන්තිම සතිය, ජීවිතේ පලවෙනි පාරට නිදිමරාගෙන රෑ zoom meeting දාගෙන පාඩම් කලා, revision කලා...exam ලියද්දි තේරුනා අන්තිම කාලෙ කරපු ප්‍රශ්න වලට සමාන ප්‍රශ්න හුගක් ඇවිත් තියෙනව කියල, ඉතින් විභාගෙ හිතුවට වඩා ලේසි උනා, මට අන්තිමට sir කියපු අනාවැකිය ඇත්ත වෙලා A1 B2 එක්ක Colombo District 85 Rank එකකුත් ආව, මම campus registration ඒකත් එක්කම kelaniya university එකේ external course එකක් කරනව ( cyber security ) ethical hacking ) sir ගැන කියනව නම් හුගක් දේවල් තියෙනව , මොන class එකකවත් මම දැකල නෑ sir ඇවිත් කරට අත දාගෙන යාලුවෙක්ට වගේ නොදන්න දේවල් individual attention එකක් දීල කරනව.



**එස්.වී. සහන් සත්මික**
**මහින්ද රාජපක්ෂ**
**විද්‍යාලය හෝමාගම**
**ඉංජිනේරු තාක්ෂණවේදය**
**2021**

**ශානුක නිර්වන්**
**අරනගන්විල**
**පෞද්ගලික අයැදුම්කරුවෙක්**



මම ශානුක නිර්වාන් මම එකතු උනේ අරලගන්විල ඉදන්...යාලුවෙක්ගේ මාර්ගයෙන් තමා මට සර්ව හම්බ උනේ මම ක්ලාස් එකට එද්දි පාඩම් ටිකවත් දන්නෙ නැතිව අවේ මට 2021 Exam එකෙන් District tank 23 ආවා මම ඌව වෙල්ලස්ස කැම්පස් එකට තෙරුනා හැමදෙම කරගත්තේ සර්ගේ class ඇවිත්...

මම 2020 මුල් කාලයදි තමා සර්ගේ physical class join වුනේ. Exam එකට මාස 3ක් තියලා වගේ අයේ සර්ගේ physical class පටන් ගත්තා Mr.tech tute එකත් එක්ක. සර් හැම ළමයෙක් ගැනම හොදින් අවදානය දුන්නා දුර්වල තැන් වලදි සර් අපිට උදව් කරා. සර්ගේ tute and papers ටිකත් එක්ක වැඩ කරලා colombo district 192 එක දක්වා එන්න මට පුලුවන් වුනා government campus යන්න හැකියාවත් සමගම. දැන් මම Marine Engineering කෙනෙක් වෙන්න ඉගෙන ගන්නවා private campus එකක. මන් ගොඩක් තැන් වලදි වැටුනාම සර් තමා මාව motivate කරේ . එවගේම සර් exam ඉවර වුනාට පස්සෙත් ළමයින්ට අනාගතේ සැලසුම් කරන්න උදව් කරනවා. Mr.Tech වෙනම brand එකක් වෙන්නේ ඒ නිසයි.



**ධනිත දිසායු මායාදුන්න**
**ආනන්ද විද්‍යාලය කොලඹ**
**ඉංජිනේරු තාක්ෂනවේදය**
**2021**

**ජී.ජී. කල්පනී වසුන්දරා**
**මහින්ද රාජපක්ෂ**
**විද්‍යාලය හෝමාගම**
**ඉංජිනේරු තාක්ෂනවේදය**
**2021**



මම Mr.tech එකත් එක්ක එකතු වුනේ 2020 දි.මම ආවේ SFT වලට විතරයි හැබැයි පලවෙනි දවසෙන්ම සර් ගැන මට විශ්වාසයක් දැනුනා. මම SFT ET වලට වගේම සර් අපි වෙනුවෙන්ම අලුතින් පටන් ගත්ත ICT Class එකටත් සහභාගී වුනා. දවස පුරා කරපු Online class, Paper class, Revision Class, පිලිවෙලට ලස්සනට තිබ්බ tutes, Ptractical class මාලාව වගේ සර්ගේ වැඩපිලිවෙල, අන්තිම කාලේ සර්ගේ class ආපු ලමයි පවා හොද ප්‍රතිඵල අරගත්තේ සර්ගේ කැපකිරීම සහ වැඩ පිලිවෙල නිසා. ඒ නිසා මටත් විෂයන් තුනටම B සාමාර්ථ තුනක් වගේම දිස්ත්‍රික් රැන්ක් 118 වෙන්න පුලුවන් වුනා. අද මම University Student කෙනෙක් උනේ සර්ගේ පංතියට මම එදා ගියපු නිසා. ඒවගේම ඒ විස්වාසයෙන් මමත් නංගිලා මල්ලිලා වගේම මගේ 2nd shy කරන යාලුවන්වත් අපේ Mr.tech එක්ක එකතු කෙරෙව්වා. අපේ උනන්දුව වගේම සර් ගේ මහන්සිය නිසා අපේ Mr.tech හැමෝගෙම ප්‍රතිඵල සතුටුදායකයි. ඒවගේම A/L වලින් පස්සේ යන්න ඕනේ පාරත් අපේ මහේෂ් සර් ලස්සනට පෙන්නලා දෙනවා වගේම පුලුවන් හැම උදව්වක්ම ලමයි වෙනුවෙන් කරනවා.

සර්ගෙ class එකටත් මං සෙට් වෙන්නේ මේකත් අනික් class වගේම කියල ඔහේ ගිහින් ඉන්නවා කියන මතය තියාගෙන...class එකට සෙට් වෙලා වැඩ කරන් යද්දි තමා තේරුනේ මේක අනික් class වලට වඩා වෙනස් class එකක් කියලා.. මොකද subject තුනම තනි මනුස්සයෙක් කරන ගමන් ඒ subject තුනට එහා ගිය වැඩ බිමට අපිව යොමු කරවන මට හම්බෙච්ච එකම ගුරුවරයා අපේ මහේශ් සර්.. A/L වලට තව කල් තියනවා. මාස තුනෙන් exam එකේ අන්තිම දවස වෙනකන් අපි එක්කම ඉදලා.. සර් මාව B1යි C2ක result එකකට ගෙනාවා.. ඒ හින්දා මම දැන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ BTech In Mechatronis මගේ සිහිනයක් වෙච්ච උපාධිය හදාරන්න select වෙලා ඉන්නවා.. ඒ අතරතුර අපේ Mr.Tech Engineering Solutions Mechanical And Robotics Team එකත් එක්ක project කිහිපයක් කරනගමන් A/L වලින් පස්සෙත් අපි MR.Tech Family එකත් එක්ක එකතුවෙලා ඉන්නවා..



**ලුතිර පෙරේරා**
**මහින්ද රාජපක්ෂ විද්‍යාලය**
**හෝමාගම**
**ඉංජිනේරු තාක්ෂණවේදය**
**2021**

**කේ. ප්‍රමෝද්‍යා සම්මානි කුමාරි**
**හෝමාගම**
**මධ්‍ය මහා විද්‍යාලය**
**ජෛව පද්ධති**
**තාක්ෂණවේදය 2021**



මුලින්ම පන්තියට අවේ online හරහා ඒ දවස් වල තිබුනු තත්ත්වේ අනුව පන්තිය තිබ්බේ online. මම ඇත්තටම SFT වලට පන්ති ගිය නැති තැනක් නැහැ නුගේගොඩ තියන හැම පන්තියකටම වගේ ගියා හැබැයි සර් ව තරම් වෙන එක පන්තියක්වත් හරි ගියේ නැහැ. ඇත්තටම මන් පන්තියක් විදිහට නෙවෙ සර්ගෙ පන්තිය දැක්කේ. ඊටත් වඩා ඒහා ගිය බැදීමක් තිබ්බා. අද මම 2021 A/L exam එකෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් 73 ස්ථානය දිනාගෙන තියනවා B 2 C 1 ක් අරන්. ඇත්තටම මම sft වලට විතරයි class අවේ ඒත් අනිත් විෂයන් 2ත් ගොඩ දාගන්න හොද motivation එකක් සර්ගෙන් ලැබුනා. Class එක ගැන කියන්න වචන නැහැ. මාව හදපු තැන තමයි Mr.Tech කියන්නේ. මගේ හිතේ හැමදාම ඒ ගෞරවය තියනවා.

ජෛව පද්ධති තාක්ෂනවේදය තෝරගෙන හිටපු මම 2021 ඒලෙවල් ලියන්න හිටියත් 2020 ඔක්තොම්බර් වෙද්දිත් ඉගෙන ගන්න ඕනි පාඩම් ටිකවත් දැනගෙන හිටියෙ නෑ.2020 ඔක්තොම්බර් මාසෙ මහේෂ් සර්ගෙ ඒලෙවල් පන්තිය ගැන අහම්බෙන් දැකපු මට ඒවෙලෙ පුදුම සතුටක් දැනුනෙ මොකද මං දන්න තරමින් මට තේරෙන විදියට උගන්නන්න පුලුවන් ගුරුවරයෙක් කියලා මම දැනගෙන හිටපු එකම ගුරුවරයා මහේෂ් සර්.. මම ගොඩක් විරුද්ධතා මැද සර්ගෙන් ලැබුන හයියට ජෛව පද්ධති තාක්ෂනවේදයෙන් ඉංජිනේරු තාක්ෂණවේදට මාරු වුනා. අද වෙනකොට මම සබරගමුව විශ්ව විද්‍යාලයට සරසවි වරම් ලබලා ඉන්නවා වගේම Automobile Technician කෙනෙක් වෙන්න මූලික පියවර තබලා ඉන්නෙ. ඒත් අද මං මෙතනට ගේන්න සර්ගෙන් ලැබුන මඟපෙන්වීම, උදව්... සර් කියන්නෙ අපි වගේ පුංචි පැල වලට මහා රූස්ස ගහක් . අදටත් මගෙ තාත්තට තරම් මම සර්ට ආදරෙයි. Mr.Tech එකේ දරුවෙක් විදියට මම දන්නවා මෙතන ඉන්න කවුරුවත් දිනන්නෙ නැතුව මගින් හැරෙන්නෙ නෑ කියලා. Mr.Tech කියන්නෙ නිකන්ම නිකන් පංතියක් නෙමෙයි. ලෝකෙ දිනන අයට මහගෙදරක්.



**යූ.එල්.කේ. දුල්මි සුබෝධා**
**ලුම්බිණි විද්‍යාලය, කොලඹ.**
**ඉංජිනේරු තාක්ශණවේදය**
**2021**

**ඕ.ජී.කවිදු විදුරංග**
**මහින්ද රාජපක්ශ**
**විද්‍යාලය, හෝමාගම**



පළවෙනිපාර විභාගෙ කෙලවුන නිසා දෙවෙනි පාර ටෙක් කරලා ගොඩයන්න හිතන් තමා සර්ගෙ පංති ආවෙ. ඒ විදියට යනකොට අන්තිම මාස තුන අපිට සජීවිව පංතියකදි හම්බෙන්න පුලුවන් උනා. ඒ මාස තුනේ අපි කලින්ටත් වඩා මහන්සිවෙලා වැඩ කරලා මුලු සිලබස් එකම ආයි පාරක් සම්පූර්ණයෙන්ම ඉවර කළා. ඒ වෙනකොට අපි pastpapers ඔක්කොම වගේ ඉවර කරලා තිබ්බෙ, model papers එක්කම. එහෙම වැඩ කරලා මන් B3 ක් දැම්මා. කලුතර දිස්ත්‍රික් 72 වෙන ගමන්ම. දැන් වයඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ඉගෙන ගන්නවා. සර්ගෙ පංතියට ආපු එක තමා මගේ ජීවිතේ හැරවුම් ලක්ෂයය. සර්ගෙ උගන්නන විලාසය වගේම සර්ගෙ උත්සහය කැපවීම නිසා තමා අපේ ජීවිත හොඳ අතට වෙනස් උනේ.

මම class එකට එන්නෙ 2020 මුල් මාස වල .කොරොනා ප්‍රශ්නය නිසා අපිට ගොඩක් වෙලාවට class තිබුනේ online ක්‍රමයට මම හුරු වෙලා නැති නිසා මම ගොඩක් වෙලාවට class එක cut කලා . හැබැයි අන්තිම මාස තුනේ තමයි මට තෙරුනේ මම මුකුත්ම බෑ . කියලා ඊට පස්සෙ සර් මාර විදිහට මහන්සි වෙලා මට B1 C2 දාලා කොළඹ දිස්ත්‍රික්කයේ 223 වෙන තැනට යන්න මග පාදලා දුන්නා. අද මම සබරගමු university එකේ engineer technology වලට තේරිලා තියනවා. මගේ අන්තිම මාස වෙද්දි තිබ්බ හීනේ උනේ කොහොම හරි exam pass වෙන්න ඕනේ කියන එක විතරයි. Mr Tech තමයි මට හොද Rank එකකට යන්න උදව් කලේ. රෑ එලි වෙනකම් exam එකේ අන්තිම දවස වෙනකම් Mahesh සර් අපේ සෙට් එකට ඉගැන්නුවා. ඒ මහන්සියේ ප්‍රතිඵල නිසා මට මේ හැමදේම ලැබුනේ. Exam එකට වඩා මගේ ජිවිතේ මම වැටුනු තැනදි නැගිටින්න ගොඩක් උදව් කලේ මහේෂ් සර්. අද මගේ miniszoo youtube චැනල් එක මේ තත්වෙ තියන්නේ සර්ගේ උදව් නිසා.. Mr.tech කියන්නෙ class එකක් විතරක් නෙවෙයි family එකක්..



**චමිදු දිනේත්‍ර**
**කොළඹ ආනන්ද විද්‍යාලය**
**ඉංජිනේරු තාක්ෂනවේදය**
**2021**



https://www.mrtech.lk

සියලුම විභාග ප්‍රතිඵල මෙහින්